**සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය - 2019**

**----------------------------------------------------**

සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අතර 2019 මාර්තු 11 දිනැති ව්‍යාපෘති සංදේශයේ ඇමුණුම ii හි 18 වගන්තිය ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘතියේ කාල සීමාව

**-------------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම අනුව, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල පවතින දැඩි රථවාහන තදබදය සැලකිල්ලට ගනිමින්, සීඝ්‍රගාමී සංක්‍රමණික පද්ධතියක් තුළින් ඵලදායී කාර්යක්ෂම සුව පහසු මගී ප්‍රවාහන ක්‍රමවේදයක් හඳුන්වාදීම වේ.

ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ජපාන යෙන් මිලියන 246,641 ක් වන අතර 2019 – 2024 කාලය සඳහා සැලසුම් කර තිබුණු අදියර හයක් (06) යටතේ ඉන් රු.මිලියන 286,839 කට සමාන ජපාන යෙන් මිලියන 200,215 ක් සැපයීමට ජපාන සහයෝගීතා නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ අදියර 01 යටතේ අත්සන් කළ අංක එස්එල්-පී 119 දරන ණය පහුසකම් ගිවිසුම අනුව, අදියර එකෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 59,100 කට සමාන ජපාන යෙන් මිලියන 41,252 ක් වූ අතර ඉන් රු.මිලියන 43,037 කට සමාන ජපාන යෙන් මිලියන 30,040 ක් සැපයීමට ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිත ආයතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2019 මාර්තු 25 දින ආරම්භ කරන ලද අතර 2024 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

**------**

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ව්‍යාපෘතියෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනම සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

**----------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. ව්‍යාපෘතියේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් පිළිබඳව නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑමට නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බවට අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාල ගෙවිය යුතු රු.603,134,847 ක් වූ උපදේශන ගාස්තු මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. මෙම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | ගෙවිය යුතු වගකීම් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කිරීම. | ඉදිරියේදී මේ පිළිබඳ කටයුතු කරනු ලැබේ. | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවියු යුතු වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ වැඩකටයුතුවල භෞතික කාර්යසාධනය

| | සංරචකය | කාර්යය | විගණන නිරීක්ෂණය | බලපෑම | ප්‍රමාදයට හේතුව | කළමනාකාරීත් වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කරවීම අධීක්ෂණය | ඉඩම් අත්පත් කර ගැනීම | අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ දුර්වලතාවයන් හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යසාධන ප්‍රගතිය සියයට | මෙය ව්‍යාපෘතිය මඟින් අරමුණු කරන ලද සියලුම අරමුණුවල බලපෑමක් ඇති කරනු ලබයි. | වන්දි ගෙවීම් යෝජනා ක්‍රමයට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේදී ඇති වූ අඩුපාඩු | අවශ්‍ය කරනු ලබන ඉඩම් හඳුනා ගැනීම අවසන් කිරීම හා ඒවායේ මායිම් නිශ්චිතව හඳුනා ගැනීම යන කරුණු විස්තරාත්මක සැලසුම් අවසන් කිරීම කෙරෙහි වැඩි බලපෑමක් කරනු ලබයි. | සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම තුලින් ව්‍යාපෘතියේ අරමුණු ලඟාකර ගැනීම සඳහා ශක්තිමත් හා ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | 10 ක් විය. මෙම නිසා ව්‍යාපෘතියෙහි කටයුතු ප්‍රමාද වී තිබුණි. | | | | |
| (ආ) | උප ව්‍යාපෘති | පැකේජ 1 - චක්‍රීය තොග<br>පැකේජ 2 - ධාවන පථයෙහි වැඩ<br>පැකේජ 3 - ඩිපෝවල වැඩ<br>පැකේජ 4 - කණු මත ඉදිවෙන නැවතුම් ස්ථාන (නැගෙනහිර)<br>පැකේජ 5 - කණු මත ඉදිවෙන නැවතුම් ස්ථාන (මධ්‍යම)<br>පැකේජ 6 - කණු මත ඉදිවෙන නැවතුම් ස්ථාන (බටහිර) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලසුමට අනුව, ජපන් යෙන් මිලියන 149,184 ක් වූ උප ව්‍යාපෘති 6 ක් 2020 ජුනි මාසය අවසන් වන විට ප්‍රදානය කිරීමට නියමිතව තිබුණද, නියමිත සැලසුම් කළ කාලය තුළ ප්‍රසම්පාදන කටයුතු අවසන් නොකිරීම නිසා එම ව්‍යාපෘති 2020 සැප්තැම්බර් දක්වා ප්‍රදානය කර නොතිබුණි. | ව්‍යාපෘතියෙහි සැලසුම්ගත කාලය හා එහි පිරිවැය ඉහල යා හැකිවීම. | උපදේශක කණ්ඩායම් සැලසුම් කළ පරිදි වැඩ කටයුතු ආරම්භ නොකිරීම. | නිර්මාණ හා අධීක්ෂණ උපදේශකවරයා 2019 අප්‍රේල් 01 දින සැලසුමට අනුව කටයුතු ආරම්භ කරන ලදී. එසේ වුවත්, 2019 අප්‍රේල් මාසය අවසන් වීමටත් පෙර 2019 අප්‍රේල් 21 දින සිදු වූ පාස්කු ප්‍රහාරය සිදු විය. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් හා ඵලදායී ව්‍යාපෘති කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති පනත සමාලෝචිත වර්ෂය තුළදී සම්මත කරගත යුතුව තිබුණි. එසේ වුවත් මෙම පනත 2020 සැප්තැම්බර් මාසය දක්වාම සම්මත කර නොතිබුණි. | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට සිදුවන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ | සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක නොවන බව නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2019 | වර්තමාන තත්ත්වය සමාලෝචනය කිරීමෙන් පසුව, පවතින නව ව්‍යාපෘති රේඛ තත්ත්වයන් සැලකිල්ලට ගෙන අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගත |

| | | | | |
|---|---|---|---|---|
| | | බාධාවන් ඇති විය හැකිය. | නොවැම්බර් මාසයේ සිට දන්වා තිබුණි. මෙම නිසා සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘති පනත සම්මත කිරීමට කටයුතු නොකර ව්‍යාපෘති කළමනාකරණ අංශයට නැවත යොමු කරන ලදී. | යුතුය. |
| (ආ) | දුම්රිය සංක්‍රමණ පද්ධතිය නැවත සකස් කිරීමේ උප ව්‍යාපෘතියෙහි කාල රාමුවට අනුව, ආංශික නිර්මාණයන් හා අත්තිවාරම් නිර්මාණයන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත් මෙම කටයුතු 2020 සැප්තැම්බර් දක්වා නිමකර නොතිබුණි. මෙම නිසා ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට සිදුවිය හැකි වීම. | අදාල ඇස්තමේන්තු ඉදිරි කටයුතු සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත යොමු කර ඇත. | නව යෝජනා සැලකිල්ලට ගෙන ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීම සඳහා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 නිශ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර 2019 දෙසැම්බර් 31 දිනට මාස 8 ක කාලයක් ගත වී තිබුණද, ණය ලබාදීමේ නියෝජිතායතනය මඟින් ප්‍රතිපාදනය කර තිබුණු රු.මිලියන 43,037 කට සමාන ජපන් යෙන් මිලියන 30,040 ක ප්‍රතිපාදනවලින් සියයට 4 ක් හෙවත් රු.මිලියන 2,029.49 කට සමාන ජපාන යෙන් මිලියන 1,250.45 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එසේම, වාර්ෂික අයවැය ප්‍රතිපාදන මඟින් සමාලෝචිත වර්ෂය සඳහා වෙන් කරදී තිබුණු රු.මිලියන 4,375 ක ප්‍රතිපාදන මුදලින් රු.මිලියන 2,476 ක් හෙවත් 57 කට සමාන මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි. | ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කළ කාලය තුළ ව්‍යාපෘතියෙහි කටයුතු නිම කිරීමට නොහැකි වීම. | නිර්මාණ උපදේශකවරුන් ඔවුන්ගේ ඉන්වොයිසි සමාලෝචිත වර්ෂය තුළ ඉදිරිපත් නොකරන ලදී. | ව්‍යාපෘතියෙහි අවශ්‍ය නොවන වියදම් වලක්වා ගැනීම පිණිස ක්‍රියාකාරී සැලසුම් හා නව යෝජනා ක්‍රම අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | උපදේශකවරුන් බඳවා ගැනීමට අදාල විෂය ක්ෂේත්‍ර ලිපියේ 05 වගන්තියට අනුව, උපදේශකයන්ගේ සුදුසුකම් ඇගයීමට ලක් කළ යුතුය. එසේ වුවත්, සුදුසුකම් ඇගයීමට ලක් නොකර ව්‍යාපෘතියේ ප්‍රධාන උපදේශකවරයා සමාලෝචිත වර්ෂය තුළ බඳවාගෙන තිබුණි. | ප්‍රධාන උපදේශකවරයාට ප්‍රමාණවත් දැනුමක් නොමැති වීම හේතුවෙන් ව්‍යාපෘතියෙන් ලබාකර ගැනීමට අපේක්ෂිත අරමුණු ලබාකර ගැනීමට නොහැකි විය හැකිය. | මහා භාණ්ඩාගාරය විසින් පත්කරන ලද අමාත්‍ය මණ්ඩල උපදේශකයන් පත් කිරීමේ ප්‍රසම්පාදන කමිටුව මඟින් උපදේශන ආයතන විසින් ඉදිරිපත් කරන ලද තාක්ෂණික යෝජනා ඇගයීම අවසන් කර ඇත. | උපදේශකයන් බඳවා ගැනීමේ විෂයානුගත කරුණු අනුව, ප්‍රධාන උපදේශකයන්ගේ සුදුසුකම් ඇගයීමට අවශ්‍ය වේ. |
| (ආ) | ව්‍යාපෘතියෙහි අරමුණු පිළිබඳ නොසලකා රු.2,267,377 ක මුදලක් මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් රේඛීය අමාත්‍යාංශය විසින් වැයකර තිබුණි. | මෙවැනි තත්ත්වයක් රජයේ රෙගුලාසිවලට අනුකූල නොවීමක් වන අතර මෙවැනි ක්‍රියාකාරකම් වංචාවලට හා රජයේ අරමුදල් අවභාවිතයට තුඩුදිය හැකි කරුණු වේ. | අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු සම්බන්ධව මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා මෙම මුදල මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් වැය කරන ලදී. | ව්‍යාපෘතියේ අරමුණු සඳහා යොදවනු ලබන අරමුදල්වල ඵලදායිත්වය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. |

**3.5 ව්‍යාපෘතියේ කටයුතු නවතා දැමීම**

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘතියේ අධික පිරිවැය, ගෙවිය යුතු අතිවිශාල වන්දි මුදල්, ගමනාගමනය සඳහා ඇති විකල්ප මාධ්‍යයන් පිළිබඳ අඩු අවධානයක් යොමුකර තිබීම සහ විශාල මෙහෙයුම් පිරිවැයක් දැරීමට සිදු වීම යනාදි ව්‍යාපෘතියේ අවාසිදායක සාධකයන් සැලකිල්ලිට ගෙන ව්‍යාපෘතිය තවදුරටත් ඉදිරියට කරගෙන යාම සම්බන්ධව ප්‍රවාහන අමාත්‍යවරයා ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සැලකිල්ලට ගෙන ව්‍යාපෘති කාර්යාලය වසා දමා සියලුම වගකීම් නිරවුල් කර 2020 ඔක්තෝබර් 06 දින සිට ව්‍යාපෘතියේ කටයුතු අත්හිටුවීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. එසේවුවත් ව්‍යාපෘතියේ කටයුතු 2021 ජනවාරි මාසය දක්වාම කරගෙන ගොස් තිබුණි. | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා (JICA) සමඟ ඇතිකරගත් ගිවිසුම අහෝසි කිරීම හේතුවෙන් රු.බිලියන 5 කට වැඩි මුදලක් ශ්‍රී ලංකා රජයට වන්දි මුදල් වශයෙන් ගෙවීමට සිදුවිය හැකි වීම. | අදහස් දක්වා නොතිබුණි. | මෙවැනි තීරණයක් ගැනීමට පෙර ව්‍යාපෘතිය හා සම්බන්ධිත මූල්‍ය හා ආර්ථික සාධක සැලකිල්ලට ගෙන විස්තරාත්මක ඇගයීමක් සිදුකළ යුතුය. |